# හෘදයාංගම ප්‍රාර්ථනය

හිස බියෙන් වෙන්කොට පැවැත්විය හැක්කේ යම් තැනකද ,
හිස සෘජුව ගෙන විසිය හැක්කේ යම් තැනකද ,
ශාස්ත්‍ර ඥාණය ලැබිය හැක්කේ යම් තැනකද ,
පටු කොටු පවුරුවලින් ලෝකය කැබලි නොකොට
ඇත්තේ හැක්කේ යම් තැනකද ,
පුරුෂ වීර්ය තම දෙ අත් සම්පූර්ණත්වය කරා
ඔසවා නොනවත්වා
ධෛර්ය වන්නේ යම් තැනකද ,
තර්කයේ නිර්මල ජලධාරාව ඇබ්බැහිකම නැමැති
මරු කතරට
වැදී සිඳී නැත්තේ යම් තැනකද ,
මාගේ පියාණනී ; ඒ වූ නිදහසේ ස්වර්ග රාජ්‍යය කරා
මාගේ රට පුබුදුවා ලන්න.
මාගේ හදවතේ දරිද්‍රතාවය මුලසුන් කල මැනව.
ශෝකයත් , ප්‍රීතියත් එකසේ දරා ගැනීමට
මට ශක්තිය දුන මැනව.
හදවත වියලී රළුව පවත්නා විට
කරුණා වර්ෂාවකින් යුතුව මා කරා එන්න.
මාගේ ජීවිතය සිරියාවෙන් වෙන්ව පවත්නා විට ගීත ගායනයේ
මන නඳින් යුතුව මා කරා එන්න
නිශ්චලත්වයේ ස්වාමීනී , ඝෝෂාවේ කන් බිහිරි කරවන හඬින්
ඈත ලෝකයෙන් මා වෙන් කරද්දී ,
ඔබගේ සාමය හා විවේකය රැගෙන මා කරා එන්න.
මාගේ සිඟන හදවත මුළු ගැන්වී හැකිලී පැකිලී සිටින විට
දොර දෙපලු කර රාජ ශ්‍රී විභූතියෙන් මා කරා එන්න.
ප්‍රබුද්ධ ශුද්ධොත්තමයාණනී ; මාගේ සිත තණ්හාවෙන් අන්ධවී
මායා දූලියෙන් වැසී පවත්නා විට
ඔබගේ ආලෝකයත් ගර්ජනාවත් මා කරා සැපත් වන්න.

(රබීන්ද්‍රනාත් තාගෝර්)